# 06. අව්‍යය පද

ජීවකයෝ එපවත් අසා ''ශාස්ත්‍ර නම් බාලය, වැඩි මහලු යැයි යන බැවහර නැති සේ ය. නුවණ නම් වයස් නිසා ඇති වන දෙයක් නොවෙයි. මා දත් ශාස්ත්‍රය මුත් මාගේ වයසින් තමන් වහන්සේට ප්‍රයෝජන කිම් ද? තෙල රැජාව සන්සිඳුවාලා මුත් නොයෙමි. වැළිදු ධන හානියකුත් නොකෙරෙමි. මාගේ ශාස්ත්‍ර බල දක්වා මුත් කිසිවක් නොගන්මි' යි කියා යවූහ...''

ඉහත ඡේදයට අනුව පහත වගුව සම්පූර්ණ කරන්න.

| නාම පද | ක්‍රියා පද |
|---|---|
| | |

ඉහත ඡේදයේ එන නාම පද හෝ ක්‍රියා පද නොවන පද තෝරා පහත වගුවේ සටහන් කරන්න.

| නාම පද හා ක්‍රියා පද නොවන පද |
|---|
| |

ඉහත ඡේදයෙන් ඔබ උපුටාගත් නාම පද සහ ආඛ්‍යාත පද හැර අනෙක් පද "අව්‍යය පද" නමින් හැඳින්වේ. ඒවා මෙසේ ඉදිරිපත් කළ හැකියි.

1 නම්
2 සේ
3 නිසා
4 නො

5 මුත්
6 ද
7 තෙල
8 වැළිදු
9 ත්
10 යි

නාම පද හා ආඛ්‍යාත පද වර නැගීමේදී වෙනස් රූප ගන්නා නමුදු, අව්‍යය පද එබඳු වෙනස් රූප නොගනී. කිසිඳු වෙනසකට භාජනය නො වී හැම තැන්හි ම එක ම රූපයකින් රැඳී සිටී. ඒවා අව්‍යය පද නමින් හැඳින්වෙන්නේ ද වරනැගීමෙන් වෙනස් රූප නොගන්නා බැවිනි.

අව්‍යය පදයන්ගේ ප්‍රභේද දෙකක් වේ.
(1) නිපාත පද
(2) උපසර්ග පද

## නිපාත පද

නිපාත පද වාක්‍යයක මුල, මැද, අග යන කොතනක හෝ යෙදේ.

වාක්‍යයක මුල - අනේ, දෙව්දත් නොදිටි මොක්පුර
අහෝ, බල බලව දෙස් පුහුදුන්
වාක්‍යයක මැද - මව ද පියා ද දරුවන් රකිති
අනුවණ දනන් සහ වාසය නොකරමි
වාක්‍යයක අග - මේ සිදුවූයේ කුමක් ද?
ඔහු ඊයේ මෙහි ආවේ සවස ද?

භාෂාවේ විවිධාර්ථවත් නිපාත පද හමුවෙයි.

- "සමුච්චයාර්ථයේ" ද, ත්, සහ, හා, යන නිපාත යෙදේ.
මම ද ළමයා ද ගෙදර යමු.
මමත් ළමයාත් ගෙදර යමු.
මව සහ පියා දරුවන් රකිති.
මව හා පියා දරුවන් රකිති.

- "සමග" යන අර්ථයෙහි සහ, සමග, කැටුව යන නිපාත පද යෙදේ.
  - හේ මා **සහ** කතා නො කෙරෙයි.
  - මම මිතුරන් **සමග** දෙඩමළු වීමි.
  - මව දරුවන් **කැටුව** නගරයට ගියා ය.

- "හැඟීම්" ප්‍රකාශනයෙහි හා :, අහා ! යන නිපාත පද යෙදේ.
  - **හාඃ** පොඩි හාමුදුරුවන්ට තෑග්ගක්.
  - **අහා!** උන්දෑගේ උස.

- සමානාර්ථයෙහි මෙන්, සේ, වැනි, බඳු ආදි නිපාත යෙදේ.
  - ගොයකු **මෙන්** බඩගා නොයව්.
  - සුරඟනක **සේ** දිස්වෙයි.
  - පෙර සුරඟනන් **වැනි** අඟනෝ සොඳුරු රුසිරෙති.
  - හේ රූ සිරින් මල්සරා **වගේ** ය.
  - කදෝපැණියෙකු බඳු ආලෝකයක් ඇතින් දිස්විය.

- කාලාර්ථයෙහි නිති, නිතොර, ඉක්බිති, දූන්, යළි, පසුව, ඉතින් ආදී නිපාත පද යෙදේ.
  - **නිති** පන්සිල් රකිමු.
  - **නිතොර** නමදිමි මුනිඳු සරණත.
  - **ඉක්බිති** ගිරවාණෝ වසුරු පිඩක් හෙළා පලා ගියෝ ය.
  - එති'යි **දූන් දූන්** කිවුය ඉඳුරා.
  - මුලිනුපුටා නොදමූ ගසෙහි **යළි** අංකුර නැගේ.
  - ඒ අස්න **පැසුළු** පවසමි.
  - **ඉතින්** අපට කාගේ පිහිටක් ද?
- සීමාර්ථයෙහි තෙක්, දක්වා යන නිපාත පද යෙදේ.
  - හේ සඳුද සිට සිකුරාද **තෙක්** වැඩ කරයි.
  - මම මහනුවර **තෙක්** දුම්රියෙන් ගමන් කළෙමි.
  - ලිපිකරුවා සෙනසුරාද **දක්වා** වැඩ කළේ ය.
  - මම මහනුවර **දක්වා** බස්රියෙන් ගමන් කළෙමි.

(මෙහිදී ලිපිකරුවා වැඩ කළේ සිකුරාද තෙක් පමණි, මා බස්රියෙන් ගමන් කළේ මහනුවර සීමාව තෙක් පමණි)

- විනාර්ථයෙහි විනා, හැර, මිස, මිසක්, මුත් යන නිපාත පද යෙදේ.
  ඉසිවතුන් **විනා** මේ ගත් කාට නො රිසි ද.
  ගඟෙන් **විනා** මුහුදෙන් පැන් පිව හැකි ද.
  සත් පුරුෂයන් **හැර** ලොවට සෙතක් කරන්නෝ කවරහු ද?
  දෙමාපියන් **හැර** දරුවනට වැඩ වඩන්නෝ කවරහු ද?
  අහරින් **මිස** අනෙකකින් කය නොවැඩේ.
  දුදනන් **මිස** සෙස්සෝ අනුනට නින්ද නොකෙරෙති.
  දෙවියෝ අමරස **මිසක්** අන් අහර නොබුදිති.
  කුසගිනි ඇතියනට බතින් **මිසක්** අනෙකකින් පලක් නැත.

- විකල්පාර්ථයෙහි හෙවත්, නොහොත්, හෝ, වැනි, නිපාත පද යෙදේ.
  මහසෙන් රජ **හෙවත්** මින්නේරි දෙවියෝ අදත් ගරු බුහුමනට ලක්වෙති.
  දෙමාපියෝ **නොහොත්** ගුරුවරු දරුවන්ට යහපත කියා දෙති.
  ළමයා **හෝ** මම ඉක්මනින් එමි.

- අවධාරණාර්ථයෙහි "ම" නිපාතය යෙදේ.
  ජාතික ගීය ගැයෙද්දී හැම දෙනා **ම** නැගී සිටියහ.

- නිෂේධාර්ථයෙහි "එපා" නිපාතය යෙදේ.
  **එපා එපා** මස් කන්නට කිරි අම්මාගේ.

- ආමන්ත්‍රණාර්ථයෙහි එම්බා, එම්බල, කොල, බොල යන නිපාත යෙදේ.
  **එම්බා** ගහලය, එක කඩු පහරින් මගේ ගෙල සිඳ දමව.
  **එම්බල** භටයිනි, වහා යුද්ධයට සැරසියව්.
  **කොල** මේ ගඟ ගැඹුරු ද?
  හැබෑනේන්නම් **බොල** මෙතන ඉන්නෙ පස්දෙනයි නෙ.

- ශ්‍රැති සූචනාර්ථයෙහි "ල" "ලු" නිපාත යෙදේ.
  සමහරු මෙබස් කියත් **ල**.
  ඔහු ඊයේ ගමට ගියේ **ලූ**.

❍ තාදර්ථයෙහි පිණිස, සඳහා, වස්, පරිදි, ලෙස යන නිපාත යෙදේ.

පොඩි හාමුදුරුවෝ පිඬු සිඟනු **පිණිස** ගමට පිවිසෙති.

රට ගොඩනගනු **සඳහා** වැඩ කරමු.

රට රකිනු **වස්** සෙබලු දිවි පිදූහ.

මතු රැකෙනා **ලෙස** කටයුතු කරමු.

සිසුවා උගතෙකු වන **පරිදි** වැඩ කරයි.

❍ වාක්‍ය සම්බන්ධාර්ථයෙහි නමුත්, එහෙත් යන නිපාත යෙදේ.

ඔහු සේවයට ගිය **නමුත්** ආපසු නො ආයේය.

පෙර නම් වැසි සමයයි. **එහෙත්** දැන් දැඩි නියඟයකි.

මීට අමතරව භාෂාවේ තවත් නිපාත පද බොහොමයක් ඇත.

## ක්‍රියාකාරකම 6.1

දිනට නියමිත ඉතිහාස පාඩම හෝ භූගෝල පාඩම හෝ වරක් නැති නම් දෙවරක් පමණ කියවූ කල එහි වූ සමහර වැදගත් කරුණු මතකයෙහි රැඳෙන්නේ ය. කෙනෙකුගේ දේශනයකට සවන් දී සිටි කල ද සිදු වන්නේ එවැන්නක් ම ය. පුවත් පතක පළවන වැකියක් කියවූ විට ද එහි ඇති අනවශ්‍ය කරුණු සියල්ලම පසෙක තිබියදී ඔබට අවශ්‍ය සේ ඔබ සලකන කරුණු පමණක් සිතෙහි ධාරණය වන්නේ ය. එසේ වැදගත් සාරවත් සහ ප්‍රයෝජනවත් විස්තර පමණක් පිඬු කර ගැනීම එතරම් පහසු කටයුත්තක් නොවේ. ඒ සඳහා යම්කිසි ක්‍රමවත් වූ ද, විධිමත් වූ ද මානසික අභ්‍යාසයක් ඕනෑ කෙරේ.

ඉහත ඡේදයේ ඇති නිපාත පද තෝරන්න.

## ක්‍රියාකාරකම 6.2

එම නිපාත පද යොදා ගනිමින් අරුත් පැහැදිලි වන සේ වැකි ගොඩ නගන්න.

## ක්‍රියාකාරකම 6.3

පහත දැක්වෙන වගුවෙහි "අ" කොටසේ එන නිපාත පද "ආ" කොටසේ එන අර්ථය හා ගළපන්න.

| අ | ආ |
| --- | --- |
| 1. කාලාර්ථය | ක් |
| 2. සහාර්ථ | විට |
| 3. සමුච්චයාර්ථ | අහෝ |
| 4. භාවාර්ථ | සමග |
| 5. විනාර්ථ | ද |
| 6. ප්‍රශ්නාර්ථ | එහෙත් |
| 7. නිෂේධාර්ථ | මිස |
| 8. අවධාරණාර්ථ | තෙක් |
| 9. ශ්‍රැති සූචනාර්ථ | ම |
| 10. සීමාර්ථ | ලු |
| 11. තාදර්ථ | එපා |
| 12. වාක්‍ය සම්බන්ධාර්ථ | පිණිස |

## උපසර්ග

ධාතු ප්‍රකෘතියක හෝ නාම ප්‍රකෘතියක අර්ථය විශේෂ වන ආකාරයෙන් එම ප්‍රකෘතියට මුලින් යෙදෙන අව්‍යය පද "උපසර්ග" නමින් හැඳින්වේ. ප්‍රකෘතියකට උපසර්ග එකතු වූ පසු එය තනි පදයක් වශයෙන් සැලකේ.

උපසර්ග එක් වීමෙන් ප්‍රකෘතිය වෙනස්කම් කීපයකට භාජනය වේ.

(1) අර්ථය තීව්‍ර කිරීම
(2) විරුද්ධාර්ථයක් ගෙන දීම
(3) අර්ථයට බාධා කිරීම

ප, පර, අව, ස, අනු, නි, දු, වි, අ, අදි, සු, උ, අබි, පරි, උප/අව, අප, පස්, පිළි, අති/ඉ, පි ආදී වශයෙන් සිදත් සඟරා ව්‍යාකරණයේ උපසර්ග විස්සක් ඇති බව සඳහන් වෙයි. එහෙත් උපසර්ග සංඛ්‍යාව සංඛ්‍යාත්මක වශයෙන් සීමා කළ නොහැක.

### (1) අර්ථය තීව්‍ර කිරීම

උදා:- මිහිරි - සුමිහිරි (සු උපසර්ගය)
රස - අතිරස (අති උපසර්ගය)
බල - පබල (ප උපසර්ගය)

ඉහත දක්වුණු පදවල විශේෂත්වය සලකා බලමු. පළමු පදයට වඩා දෙවන පදයෙහි අර්ථය තීව්‍ර කිරීමක් හැඟවේ. එය සිදුවන්නේ පදයට මුලින් එක්වූ උපසර්ගය නිසා ය.

උපසර්ග පදයක් කේවලව ගත් කල සෘජු අර්ථයක් ප්‍රකාශ කළ නොහැකි ය. නාම පදයක් උපසර්ග පදයක් හා එක්වූ පසු අර්ථවත් වෙයි.

ඉහත උදාහරණ සැලකීමේ දී,

පේෂල
මිහිරි
බල
විශේෂ

යන පද සඳහා පිළිවෙළින් සු, අති, ප, සු යන උපසර්ග එක් වූ පසු එම පදවල අර්ථයෙහි විශේෂත්වයක් පෙන්නුම් කෙරේ.

### (2) විරුද්ධාර්ථයක් ප්‍රකාශ කිරීම

උදා:- මල - නිමල (නි උපසර්ගය)
බල - දුබල (දු උපසර්ගය)
ගුණ - අවගුණ (අව උපසර්ගය)

### (3) අර්ථයට බාධා කිරීම

උදා:- දන - දුදන (දු උපසර්ගය)
බල - අබල/දුබල (දු/අ උපසර්ගය)
පවත් - අපවත් (අ උපසර්ගය)
මාන - අවමාන (අව උපසර්ගය)

ඉහත සඳහන් පද විමසීමේදී පැහැදිලි වන්නේ මුල් පදවලට උපසර්ගය එක්වූ පසු දෙවන පදය අර්ථයට බාධා පමුණුවන බවයි.

## ක්‍රියාකාරකම 6.4

(1) පහත සඳහන් වගුව සම්පූර්ණ කරන්න.

| උපසර්ග පද | අර්ථය තීව්‍ර කරයි | විරුද්ධ බවක් ප්‍රකාශ කරයි | අර්ථයට බාධා කරයි |
|---|---|---|---|
| පබල<br>නිර්මල<br>සුබල<br>නිර්ගුණ<br>අපකීර්ති<br>පිළිතුරු<br>අවජාත<br>අධිපති<br>උදුළ<br>අවධාරණ | | | |

## ක්‍රියාකාරකම 6.5

පහත සඳහන් පදවලට යෝග්‍ය උපසර්ග යොදමින් වාක්‍යය නිර්මාණය කරන්න.

1. මිහිරි
2. දුක්
3. නම්බුව
4. දුළ
5. ලජ්ජි

## ක්‍රියාකාරකම 6.6

පහත සඳහන් පද්‍යයේ උපසර්ග යෙදුණු පද තෝරා, උපසර්ගය වෙන් කොට දක්වන්න.

පිරිසිදු සුසිනිඳු සළු ඇඳ ගන්නට
සුදනෙක් වෙනවද දුදනෙක් කිසිවිට
සුවිසල් දුර්ගුණ කෙනෙකුට ඇතිවිට
අවපස සඳලෙස පිරිහෙයි හැමවිට